# දෙවන වාර පරීක්ෂණය - 2020

## 13 ශ්‍රේණිය - ව්‍යාපාර අධ්‍යයනය - පිළිතුරු

## I පත්‍රය

| | | |
|---|---|---|
| (01) - 4 | (11) - 2 | (21) - 4 |
| (02) - 3 | (12) - 2 | (22) - 5 |
| (03) - 2 | (13) - 3 | (23) - 4 |
| (04) - 2 | (14) - 2 | (24) - 4 |
| (05) - 4 | (15) - 4 | (25) - 4 |
| (06) - 5 | (16) - 2 | (26) - 1 |
| (07) - 3 | (17) - 3 | (27) - 5 |
| (08) - 4 | (18) - 3 | (28) - 2 |
| (09) - 3 | (19) - 2 | (29) - 3 |
| (10) - 2 | (20) - 2 | (30) - 5 |

31. (අ) සිංගප්පූරුව (ආ) පාරිභෝගික ජාත්‍යන්තරය
32. (අ) පීඩන (ආ) ගෝලීයකරණය, සෘණාත්මක
33. (අ) නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය, ප්‍රමාණාත්මක ණය පාලනය.
    (ආ) ව්‍යාපාරිකයාට, පාරිභෝගිකයාට
34. (අ) සීමිත පොදු සමාගම්, 2007 අංක 7
    (ආ) ඇපයෙන් සීමිත
35. (අ) ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය
    (ආ) ශ්‍රී ලංකා සුලු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත මණ්ඩලය
36. (අ) විද්‍යුත්, වාචික (ආ) ප්‍රතිපෝෂණය, ප්‍රතිචාරය
37. (අ) ඉදිරි පෝෂණය පාලනය (ආ) කාර්ය අභිමුඛ ශෛලිය, සේවක අභිමුඛ
38. (අ) ස්ථාවර ස්ථානීය පිරීයත (ආ) ආරක්ෂිත, ආර්ථික ඇණවුම්
39. (අ) දිගුකාලීන සම්බන්ධතා, පාරිභෝගික තෘප්තිය
    (ආ) අභ්‍යන්තර අලෙවිකරණය, සමෝධානික අලෙවිකරණය, සම්බන්ධතා අලෙවිකරණය, කාර්යඵල/සමාජ වගකීම් අලෙවිකරණය.
40. (අ) වෘෂභ වෙළෙඳපල (Bull Market)
    (ආ) වලසා වෙළඳපල (Bear Market)
41. 1. වේගයෙන් වෙනස්වන බව/ගතික බව 2. සංකීර්ණ බව
    3. තරඟකාරී බව 4. ගෝලීයබව
    5. පාලනය කළ නොහැකිවීම.
42. 1. පුද්ගල විශේෂිකරණය 2. අතිරික්ත නිෂ්පාදනය
    3. භාණ්ඩ හුවමාරුව 4. වෙළෙඳම
43. 1. කාඩ්පත් හිමියා 2. කාඩ්පත් නිකුත් කරන ආයතනය
    3. වෙළෙන්දා 4. ණයපත් සංගමය
44. 1. සියලු අවදානම් ඔප්පුව 2. පූර්ණ අලාභය පමණක් ගෙවන ඔප්පුව
    3. තොටුපල ඔප්පුව 4. අළුත්වැඩියා ඔප්පුව 5. තැනීම් හානි ඔප්පුව
45. 1. අමුද්‍රව්‍ය කලට වේලාවටසපයා ගැනීමට.
    2. නිමිද්‍රව්‍ය කලට වේලාවට සපයා ගැනීමට.
    3. සේවකයන් වේලාවට ගෙන්වා ගැනිමට.
    4. ව්‍යාපාරික සබඳතා පැවැත්වීමට.
    5. වෙළඳපල ව්‍යාප්තියට.
46. 1. ස්වභාවික සම්පත් බෙදීයාමේ විෂමතාව. 2. සාපේක්ෂ පිරිවැය වාසිය.
    3. සමහර නිෂ්පාදිත සම්බන්ධව සමහර රටවල ඒකාධිකාරයක් තිබීම.
    4. භාණ්ඩ ප්‍රවර්ධනය. 5. වෙළෙඳ බාධක අවමවීම.
47. 1. පරිසර වෙනස්වීම. 2. වෙළෙඳපොල අස්ථාවර වීම්
    3. ගෝලීයකරණය 4. සංස්කෘතික විවිධත්වය 5. දැඩි තරගය

48. 1. භාණ්ඩ සංවර්ධන අදියර 2. හඳුන්වාදීමේ අදියර
3. වර්ධන අදියර 4. පරිණත අදියර

49. 1. අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළඳපොළ 2. දේශීය විදේශීය විනිමය වෙළඳපොල
3. භාණ්ඩාගාර බිල්පත් වෙළඳපල 4. වාණිජ පත්‍රිකා වෙළඳපල

50. 1. අධ්‍යාපන සුදුසුකම් 2. වෘත්තීය සුදුසුකම් 3. කායික යෝග්‍යතාව
4. පළපුරුද්ද 5. ආකල්ප හා ලැදියාව 5. බුද්ධි මට්ටම

## II - කොටස

01. (i) (අ) ව්‍යාපාර ක්‍රියාවලියේ නිෂ්පාදනය, අලෙවිකරණය, මූල්‍ය පරිපාලනය, පර්යේෂණ හා සංවර්ධනය, මානව සම්පත් කළමනාකරණය යනාදීකාර්යයන් සියල්ල භාවිතය හා කළමනාකරණය සමෝධානික කරමින් සමස්ථ ව්‍යාපාර කටයුතු සුමටව ගලායාමට නවීන තාක්ෂණය හෝ අන්තර්ජාලය භාවිතා කිරීම විද්‍යුත් ව්‍යාපාර ලෙස හඳුන්වයි. විද්‍යුත් වාණිජ්‍යය යනු අන්තර්ජාලය හරහා භාණ්ඩ මිලදී ගැනීම හා විකිණීමයි. විද්‍යුත් වාණිජ්‍යය විද්‍යුත් ව්‍යාපාර තුළ අන්තර්ගතය. (අර්ථගැන්වීමට ලකුණු 2)

(ආ) 1. මිහිකත සමුළුව මගින් ගනුලබන ක්‍රියාමාර්ග (කියෝටෝ සම්මුතිය)
2. වියානා සම්මුතිය මගින් ඕසෝන් ස්ථරය සුරැකීම.
3. පරිසර කළමනාකරණය සම්බන්ධව ජාත්‍යන්තර ප්‍රමිති පද්ධති හඳුන්වා දීම. (ISO -14001)
4. න්‍යෂ්ටික අපද්‍රව්‍ය කළමනාකරණය.
5. හරිත නිෂ්පාදිතවලට අවතීර්ණ වීම.
6. ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන් හඳුන්වාදීම.
7. කාබන් වෙළඳමට යොමුවීම.
8. හරිතාගාර වායු විමෝචනය පාලනය. (කරුණකට 1/2බැගින් කරුනු4ට ලකුනු 2)

(ii)(අ) 1. ස්වයං නිෂ්පාදනයෙන් 2. හිඟමන් ගැනීමෙන් ලබාගැනීම.
3. හුවමාරුවෙන්. 4. බලහත්කාරයෙන් ලබා ගැනීම.(සමාජය අනුමත නොකරන ක්‍රමයකි.)
(කරුණු 2ට ලකුණු 2)

(ආ) 1. විකුණුම්කරු හා ගැනුම්කරු මුහුණට මුහුණ හමුනොවීම.
2. පරිඝණක තොරතුරු මගින් විකුණුම් හා මිලට ගැනුම් ගිවිසුම් සකස් කිරීම.
3. බොහෝ විට ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගනුදෙනු සිදුවීම.
4. පිළිගත් ණය කාඩ්පත් මගින් ගෙවීම සිදුකිරීම.
5. බෙදාහැරීම සඳහා කුරියර් සේවාව භාවිතා කිරීම.
6. භාණ්ඩය භෞතිකව පරීක්ෂා කළ නොහැකි වීම. (කරුණු 4ට ලකුණු 2යි කරුණකට 1/2බැගින්)

(iii) 1. අයිතිවරුවන් සඳහා වූ අරමුණු :
උදා : 1. ලාභ ඉපයීම. 2. වෙළෙඳ පොලේ රැඳී සිටීම. 3. වෙනත් පිළිගත හැකි.
2. සේවකයින් සඳහා වූ අරමුණු :
උදා : 1. ඉහළ වැටුප්. 2. රැකියා සුරක්ෂිතතාවය. 3. වෙනත් පිළිගත හැකි.
3. ගනුදෙනුකරුවන් සඳහා වූ අරමුණු :
උදා : 1. ගුණාත්මක භාණ්ඩ. 2.ආචාරශීලී වීම. 3. සාධාරණ මිල.
4. සමාජය සඳහා වූ අරමුණු :
උදා : 1. පරිසරය සුරැකීම. 2. සමාජ සුබසාධනය. 3. රැකියා අවස්ථා.(උදාහරණ සමග කරුණු 4ට ලකුණු 4)

(iv) (අ) 1. ද්විත සමපාතයක් නොතිබීම. 2.හුවමාරු අනුපාතය තීරණ කිරීමේ ගැටළුව.
3. කුඩා කොටස්වලට බෙදාහැරීමේ අපහසුව. 4. භාණ්ඩ ප්‍රවාහනයේදී ගැටළු මතුවීම.
5. භාණ්ඩ නශ්‍යවීම. (කරුණු 4ට ලකුණු 2යි. කරුණකට 1/2 බැගින්)
(ආ) 1. ගනුදෙනුකරුවන් 2. සේවකයින් 3. අයිතිකරුවන් 4. සමාජය
(නම් කිරීමට ලකුණු 1, පැහැදිලි කිරීමට ලකුණු 1)

(v)(අ) මිනිසුන්ගේ අවශ්‍යතා හා වුවමනා ඉටුකිරීම සඳහා වෙළඳපොළට ඉදිරිපත් කරනු ලබන ඕනෑම දෙයක් වේ. මේවා වෙළෙඳ පොළ පිළිගැන්වීම් හෙවත් වෙළඳ පොළ අලෙවි අයිතමයන් ලෙසද හඳුන්වයි. (ලකුණු 2)

(ආ) 1. ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු වීම. 2. ව්‍යාපාරයේ කීර්තිනාමය වර්ධනය වීම.
3. ව්‍යාපාරය පිළිබඳ විශ්වාසනීයත්වය තහවුරුවීම. 4. ගනුදෙනුකරුවන් තෘප්තිමත් කළහැකි වීම.
5. ව්‍යාපාරයේ අරමුණු හා පරමාර්ථ ළඟා කර ගැනීමට පහසුවීම.
(කරුණු 4ට ලකුණු 2යි. කරුණකට 1/2 බැගින්)

02. (i)

| සාධක | හේතු |
|---|---|
| 1.ප්‍රතිපෝෂකයින්(ගනුදෙනුකරු) | ගැනුම් චර්යාව හාමිලදී ගැනීමේ දී සැලකිලිමත් වියයුතු කරුණු සම්බන්ධ ආචාරධර්ම ගොඩනැගීම. |
| 2.අමුද්‍රව්‍ය හා අනෙකුත් යෙදවුම් (සැපයුම්කරු) | අමුද්‍රව්‍යවල ගුණත්වය තහවුරු කරගැනීමට අවශ්‍ය ආචාරධර්ම ගොඩනැගීම. |
| 3.නිෂ්පාදන ක්‍රියාවලිය (සේවකයින්) | ගුණත්වය ඉහළ නැන්වීමට අවශ්‍ය සේවක චර්යාව හා සේවක විනය සම්බන්ධව ආචාර ධර්ම ගොඩනැන්වීම. |
| 4.ලාභයට වඩා සමාජ වගකීම (අයිතිකරුවන්) | ගුණත්වය හා ලාභාය පිළිබඳ සමබරතාවයක් ඇතිකරගැනීමට අදාළ ආචාරධර්ම ගොඩනැන්වීම. |
| 5.ආචාරධර්ම සුරැකීම.(තරඟකරුවන්) | තරඟකාරිත්වය ප්‍රතිචාර හා උපායමාර්ග සම්බන්ධ ආචාර ධර්ම ගොඩනැන්වීම. |

(සාධක 4ට ලකුණු 1/2 බැගින් ලකුණු 2, විස්තර කිරීමට 1/2 බැගින් ලකුණු 2)

(ii)(අ) 1.බදු ගෙවීම. 2. දේශීය සම්පත් භාවිතය.
3. රජය ක්‍රියාත්මක කරන ප්‍රතිපත්ති පිළිපැදීම. 4. නීති රීති පිළිපැදීම.
5. සේවානියුක්තියට දායක වීම. 6.පරිසරයට වනහානිය අවමකිරීම. (ඕනෑම 4කට ලකුණු 2)

(ආ) * ආයතනික භාණ්ඩ සඳහා රේගු බදු අයකිරිමෙන් ආනයන සීමා වන අතරම දේශීය නිෂ්පාදනය වර්ධනය කරගත හැකිය.
* දේශීය නිෂ්පාදිත මත බදු අයකිරීමෙන් භාණ්ඩ හා සේවා වල මිල ඉහළ යාම සිදුවිය හැකිය.
* රජය, යටිතල පහසුකම් මත වියදම් දැරීම නිසා ව්‍යාපාරික කටයුතු පහසු කෙරේ. (නිදසුන් 2ට ලකුණු 2)

(iii) (අ)*වෙළඳපොළ තුළ භාණ්ඩ හා සේවා බහුල වීම.
* තරගකාරිත්වය වැඩිවීම නිසා වෙළඳපලතුළ විෂමාචාර ඇතිවීමට ඇති ඉඩ වැඩිවීම.
* නිදහස් වෙළඳම සමග වෙළඳපොළ සංකීර්ණ වීම.
* ගෝලීයකරණය සමග ඇතිවිය හැකි සමාජ හා සංස්කෘතික පිරිහීම.
* පරිසර දූෂණය වැළැක්වීම සඳහා පාරිභෝගිකයන්දැණුවත් කිරීම අවශ්‍ය වීම. (කරුණු 4ට ලකුණු 2)

(ආ) * ස්වේච්ඡාවෙන්. * SLS සහතික ලාංඡන ක්‍රමය මගින්.
* පූර්ව අපනයන පරික්ෂාව මගින් * ආනයන පරික්ෂාව මගින්.
* අපනයන පිළිබඳ පිළියෙළ කළමුහුදු ආහාර පරික්ෂාව මගින්. (කරුණු 4ට ලකුණු 2)

(iv) (අ) බද්ධ ව්‍යාපාරයකි. (ලකුණු 1)
යහපත් ලක්ෂණ : 1. වාචිකගිවිසුමක් වත ඇරඹීම.
2. ලියාපදිංචිය අනිවාර්ය නොවීම.
3. නිශ්චිත නමක් නොතිබීම.
4. කෙටිකාලීන අරමුනු හා ඇරඹීම.
4. ගිණුම් තැබීම හා විගණනය අනිවාර්ය නොවීම.
5. නෛතික පුද්ගලභාවයක් නොතිබීම. (කරුණු 2ට ලකුණු 1)

(ආ) හවුල් ව්‍යාපාර
යහපත් ලක්ෂණ : 1. අලාභය බෙදීයාම.
2. ව්‍යාපාරික අවදානම බෙදීයාම.
3. සාපේක්ෂව දිගුකාලීන පැවැත්මක් තිබීම.
4. ලියාපදිංචිය අනිවාර්ය නොවීම.
5. නිශ්චිත ස්ථානයක් තිබීම. (කරුණු 2ට ලකුණු 2)

(v)(අ) වරලත් ව්‍යාපාරවල වාසි : 1. ආයෝජනයකින් තොරව විශාල පුරස්කාරයක් ලැබීම.
2. වෙළඳපොළ ව්‍යාප්තකරගත හැකිවීම. (කරුණු 1ට ලකුණු 1)
වරලත් ව්‍යාපාරවල අවාසි : 1. වරලත් ගිවිසුමට අනුව කටයුතු කිරීමට සිදුවීම.
2. ව්‍යාපාරික රහස් සංයෝජනය පිටතට ගලා යාම.
(කරුනු 1 ට ලකුණු 1)

(ආ) 1. නිෂ්පාදන වරලත් ව්‍යාපාර - කොකා කෝලා, පෙප්සි කෝලා
2. නිෂ්පාදිත වරලත් ව්‍යාපාර - සිපෙට්කෝ අලෙවිසැල්
3. ව්‍යාපාර ක්‍රමය සඳහා වූ වරලත් ව්‍යාපාර - මැක්ඩොනල්ඩ්, පීසා හට්,...(ලකුණු 2)

03. (i) (අ) 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ආඥා පනත.
ක්‍රියාපටිපාටිය :
1. ව්‍යාපාරය ආරම්භ කිරීමට අපේක්ෂා කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් හවුල් ව්‍යාපාරයක් ලියාපදිංචියට අදාළ ඉල්ලුම් පත්‍රය ලබාගැනීම.
2. අදාළ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීගෙන් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම සඳහා වූ වාර්තාව ලබා ගැනීම.
3. අදාළ ග්‍රාම නිලධාරී වාර්තාව සහ ආකෘති පත්‍රය ලියා පදිංචි ගාස්තුද සමඟ ප්‍රාදේශීය ලේකම් වෙත භාර දීම.
4. ප්‍රාදේශීය ලේකම් මගින් ලියාපදිංචි කිරීමේ සහතිකය ලබා ගැනීම. (ලකුණු 2)

(ආ) සමානකම් : 1. පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධාන වීම.
2. ලියාපදිංචිය අනිවාර්ය වීම.
3. ගිණුම් තැබීම හා විගණනය අනිවාර්ය වීම.
4. නෛතික පුද්ගල භාවයක් තිබීම. (කරුනු 2ට ලකුණු 1)

අසමානකම් :

| **සමුපකාරය** | **සංස්ථාපිත සමාගම්** |
|---|---|
| 1. ලියාපදිංචිය 1992 අංක 11 දරණ සමුපකාර (සංශෝධන) පනත | 1. 2007 අංක 07 දරණ සමාගම් පනත |
| 2. කොටසකට නිශ්චිත අගයක් ඇත. | 2. නිශ්චිත අගයක් නැත. |

(කරුනු 2ට ලකුණු 1)

(ii)(අ)

නව්‍යතා සොයාගැනීම
↓
සංකල්ප ගොඩනැගීම හා ව්‍යාපාර සැලැස්ම සැකසීම.
↓
අවශ්‍ය සම්පත් සම්පාදනය
↓
යථාර්ථයක් බවට පත්කර ගැනීම.
↓
ප්‍රතිලාභ ලැබීම.

(හෝ පිළිගත හැකි රූපසටහනකට ලකුණු 2)

(ආ) 1. අවස්ථා
2. ප්‍රමාණවත් සම්පත්
3. කළමනාකරණ කණ්ඩායම්/කළමනාකරණය (ලකුණු 2)

(iii)

| **ව්‍යවසායකයා** | **කළමනාකරු** |
|---|---|
| 1. තමා අවදානම් දරමින් ලාභ හෝ පාඩු දරයි. | ව්‍යාපාර කටයුතු මෙහෙයවීමට වැටුප් ලබයි. |
| 2.ව්‍යාපාරයේ හිමිකරුය. | ව්‍යාපාරයේ සේවකයෙකි. |
| 3. නවෝත්පාදනයට මුල්තැන ලබාදෙයි. | මෙහෙයුම් කාර්යක්ෂමතාවයට මුල්තැන ලබාදෙයි |
| 4. ව්‍යාපාරයක් ආරම්භකර පවත්වාගෙන යයි. | ඇරඹූ ව්‍යාපාරයේ මෙහෙයුම් කටයුතු කරගෙනයයි. |

(ලකුණු 4)

(iv) (අ)* කල්බදු මූල්‍යකරණය. * කුලී පිට ගැණුම් පහසුකම් සැපයීම.
* කෙටිකාලීන ණය සැපයීම. * කාලීන තැන්පතු භාරගැනීම.
* රජයේ සුරැකුම්පත්වල ආයෝජනය. * දේපළ හා ඉඩම් වෙළඳම් කිරීම. (කරුණු 4ට ලකුණු 2)
(ආ) * ඉහළ වටිනාකමකින් යුත් වත්කම් මුළු මුදලම නොගෙවා භාවිතයට ඉඩ ලැබීම.
* කල්බදු සඳහා ගෙවන කුලිය ආදායම් බද්දෙන් නිදහස් වීම.
* යන්ත්‍ර යල් පැනීම නිසා ඇතිවන පාඩු හා ප්‍රාග්ධන අලාභ මගහැරීම.
* විශාල මුදලක් ආයෝජනය නොකර වැඩි ආදායමක් ඉපයිය හැකිවීම. (කරුණු 4ට ලකුණු 2)

(v)(අ) * පිරිවැය අඩුවීම. * තදබදය අඩුවීම. * නිරවද්‍යතාවය ඉහළවීම.
* කාර්ය මණ්ඩලය අඩුකරගත හැකිවීම.
* බැංකු සේවා පුළුල් වී බැංකු ලාභදායිත්වය වැඩිවීම. (කරුණු 4ට ලකුණු 2)
(ආ) * ගිනුමේ ප්‍රමාණවත් මුදල් නොමැති වීම.
* අණකරු විසින් ගෙවීම් නතර කර තිබීම.
* අණකරු බුන්වත් වීම. * ගානිෂි නියෝගයක් ලැබීම.
* ලිඛිත වැරදි. * ගිණුම වසා තිබීම.
* අණකරු මරණයට පත්වීම. (කරුණු 4ට ලකුණු 2)

04. (i) **ජීවිත රක්ෂණය** | **ගිණි රක්ෂණය**

| ජීවිත රක්ෂණය | ගිණි රක්ෂණය |
|---|---|
| * අවදානම නිශ්චිත වේ. | * අවදානම නිශ්චිත නොවේ. |
| * හානි පූර්ණ මූලධර්මය අදාළ නොවේ. | * හානි පූර්ණය අදාළ වේ. |
| * ඉතිරිකිරීමක් හෙවත් ආයෝජනයකි. | * හානියකදී පමණක් වන්දි ලැබේ. |
| * පැවරිය නොහැක. | * පැවරිය හැක. |

(ඉහත වෙනස්කම් සහිත පැහැදිලි පිළිතුරට ලකුණු 4)

(ii)(අ) හානිය සිදුවීමට බලපෑ ආසන්නතම හේතුව රක්ෂණ ගිවිසුමෙන් ආවරණය වන්නේනම් පමණක් අදාළ වන්දිය ගෙවනු ලබනඅතර එසේ නොවන අවස්ථාවල වන්දි ගෙවීම ප්‍රතික්ෂේප වේ.(පැහැදිලි කිරීමට ල 2)

(ආ) පණිවුඩව නිසිපරිදි ලැබුනු බවටත් එය නිවැරදිව ලබන්නා තේරුම්ගත් බවටත් තහවුරු කරගැනීමට යවන්නාට ප්‍රතිපෝෂණය ඉතාමවැදගත් වේ. එබැවින් සන්නිවේදන ක්‍රියාවලියේ ඉතා වැදගත් පියවරකි. (ලකුණු 2)

(iii)(අ) * අන්තර්ජාලය * විද්‍යුත් තැපැල* ඉන්ට්‍රානෙට් * ෆැක්ස් * ජංගම දුරකථන * ඉන්ටර්කොම්
* හඬ තැපෑල (ඉහත කරුණු 4ක් දක්වා එකිනෙක කෙටියෙන් පැහැදිලිකිරීමට ලකුණු 2)

(ආ) * විවිධ නිෂ්පාදකයින් නිපදවන භාණ්ඩ හා සේවා ලබාගෙන අවශ්‍ය වේලාවට පහසු ස්ථානයකදී පාරිභෝගිකයාට ලබාදීමට කටයුතු කිරීම.
* නව භාණ්ඩ හා සේවා හඳුන්වාදීම පහසුවීම.
* වෙළෙඳපොළ තොරතුරු අදාළපාර්ශ්වයන්ට පහසුවෙන් ලබාගත හැකිවීම.
* හුවමාරු ක්‍රියාවලිය සරල වීම. (වාසි 4ක් දැක්වීමට ලකුණු 2)

(iv)(අ) * ආනයන සීමා කිරීම්/පංගු කිරීම්. * අපනයන සීමා කිරීම් / පංගු කිරීම්.
* ආනයන/අපනයන තහනම් කිරීම. * වෙළඳ ගිවිසුම්.
* දැඩි විනිමය ප්‍රතිපත්ති. (නිදසුන් 4ට ලකුණු 2)

(ආ) 1. තේ - ශ්‍රී ලංකා තේ මණ්ඩලය.
2. එලවළු, කුළු බඩු හා බුලත් - ආනයන අපනයන පාලක දෙපාර්තමේන්තුව
3. පොල්, කපාපු පොල්. පොල් කොළ ආශ්‍රිත නිෂ්පාදන - පොල් සංවර්ධන අධිකාරිය
4. මැණික් හා ස්වර්ණාභරණ - රාජ්‍ය මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය.
(ආයතනවල නම් නිවැරදිව ඇතුළත් සම්පූර්ණ පිළිතුරට ලකුණු 2)

(v)* නිදහස් වෙළඳමට එරෙහි තීරු බදු හා තීරු බදු නොවන බාධා ඉවත්වීම.
* රටවල් අතර සහයෝගිතාව වර්ධනය වීම.
* වෙළෙඳගිවිසුම් හරහා තම රටේ නිෂ්පාදිත සඳහා ස්ථිර වෙළඳපොළක් හිමිවීම.
* සාමාජික සෑම රටකටම සමාන වරප්‍රසාද හිමිවීම.
* ගෝලීය මුල්‍ය සහයෝගීතාව වර්ධනයවීම හා මුල්‍ය ස්ථායිතාව සහතික වීම.
* රැකී රක්ෂා පුළුල්වීම හා තිරසර ආර්ථික සංවර්ධනය සහ දුප්පත්කම අඩුවීම.
(නිදසුන් 4ක් දක්වමින් පැහැදිලි කිරීමට ලකුණු 4)

05. (i) (අ) * විශේෂඥතාව දක්වන ක්ෂේත්‍රය * බලතල හෙවත් අධිකාරිය
* කටයුතු වල ස්වභාවය

(ආ) 1. පුද්ගලාන්තර භූමිකාව 2. තොරතුරු භූමිකාව3. තීරණ භූමිකාව
(ඉහත (අ) සහ (ආ) කොටසේ දක්වා ඇති ආකාරයට පිළිතුරු සපයා ඇත්නම් සම්පූර්ණ ලකුණු දෙන්න.)

(ii)(අ) 1. ඵලදායීතාවය වැඩිකිරීම. 2. පිරිවැය පාලනය
**ඵලදායීතාවය පාලනය යනු :** අඩු යෙදවුම් ප්‍රමාණයකින් ඉහළ නිමැවුමක් ලබාගැනීම. **පිරිවැය පාලනය යනු :** ආයතනිකකටයුතුවලදී එහි පිරිවැය අවම කිරීමට උත්සාහ දැරීම. (ලකුණු 2)

(ආ) සැලසුම්කරණයයනු ව්‍යාපාර ආයතනයක් ළඟාකරගැනීමට අපේක්ෂිත තත්වයන් නිර්මාණය කිරීමෙන්ජ් සඳහා කළයුතු ක්‍රියාකාරකම් නිශ්වය කිරීමටත් උචිත ආකාරයට වැඩ පිළිවෙලවල් නිර්මාණය කිරීම වන අතර, සැලසුම් කරණයේ ප්‍රතිඵලයනැතහොත් සැලසුම්කරණය තුළින් ගොඩනගන ලිඛිත ලේඛනය සැලැසුමකි.
(ලකුණු 2)

(iii)(අ) කුමන ව්‍යාපාරයක වුවද සාර්ථකත්වයෙන් ඉදිරියට මෙහෙයවා පවත්වාගෙන යාමට උපකාර වන්නේ නායකත්වයයි. තම යටත් පිරිසට මඟ පෙන්වයි. අභිප්‍රේරණය කරයි. දුර්වලතා මඟහරවා සාර්ථකත්වයට මඟ පෙන්වයි. ඉලක්ක පරමාර්ථ දෙසට ව්‍යාපාර ආයතනය යොමුකරයි. (මෙම පිළිතුරු ඇතුළත්ව ඇත්නම් සම්පූර්ණ ලකුණු දෙන්න.)

(ආ) අග්‍රකළමනාකරු සඳහා බලතල පහත කළමනාකරණ ස්ථරවලට පවරා දීමයි.
අග්‍ර කළමනාකරණ කටයුතු පහසුවීම, ඔවුනට ඉක්මනින් තොරතුරු දැනුම්දිය හැකිවීම, ඉක්මනින් තීරණගත හැකිවීම. සැලසුම් නිසිපරිදි ක්‍රියාත්මක කළ හැකි වීම. (කරුණු 4ක් දක්වා ඇත්නම් ලකුණු 2)

(iv) පිරියත සැලස්ම යනු : නිෂ්පාදන ආයතනයක නිෂ්පාදන කටයුතු පැවැත්වීම සඳහා අවශ්‍ය විවිධ ද්‍රව්‍ය උපකරණ යන්ත්‍ර කාර්ය මධ්‍යස්ථාන සේවකයන් නිවැරදිව ස්ථානගතකර ඇති ආකාරය පිරියත සැලැස්මයි.

වාසි : * නිෂ්පාදන කාර්ය වඩා සුමටව සිදුකළ හැකිවීම.
* මෙහෙයුම් කටයුතුවල නම්‍යතාව ඇතිවීම.
* පවත්නා ඉඩකඩින් උපරිම ප්‍රයෝජන ගතහැකි වීම.
* සුපරික්ෂණය පහසුවීම.
* අනවශ්‍ය සේවක චලන අඩුවීම.

(පිළිතුරු ප්‍රමාණවත්ව දක්වා ඇත්නම් සම්පූර්ණ ලකුණු දෙන්න. වාසි 4ක් දක්වා ඇත්නම් ලකුණු 2ක් දෙන්න.)

(v)(අ) **තත්ව පාලනය :** නිෂ්පාදන ආයතනය විසින් ස්ථාපිතකරන ලද ප්‍රමිතීන්ට අනුකූල නිෂ්පාදන කටයුතු සිදුවන්නේද රටේ නෛතික අවශ්‍යතාවයන්ට අනුව නිෂ්පාදන කරනු ලබන්නේද යන්න තහවුරු කරගැනීමේ ක්‍රියාවලිය.

**තත්ව ආරක්ෂණය :** නිෂ්පාදන ආයතයක නිෂ්පාදන ක්‍රියාකාරකම්තුළින් නිපදවන ලද නිෂ්පාදිත ගනුදෙනුකරුවන්ට සැපයීමේදී එහි ගුණාත්වය පිළිබඳ සහතික කිරීමක් ලබාදීමට කටයුතු කිරීම.

(ආ) **නිෂ්පාදන අංශය**

| **නිෂ්පාදන ඉංජිනේරු කරුණු** | **නිෂ්පාදන සැලසුම් කරුණු** | **ද්‍රව්‍ය මිලදී ගැනීම** | **නිෂ්පාදන පාලනය** |
|---|---|---|---|
| යන්ත්‍ර | * කෙටිකාලීන නිෂ්පාදන වැඩසටහන් | * ද්‍රව්‍ය | * ගුණත්වය |
| ශ්‍රමිකයින් | | * පිරිවැය | * තත්ව පාලනය |
| නිෂ්පාදන කාලසටහන | * දිගුකාලීන නිෂ්පාදන | * ද්‍රව්‍ය ගුණත්ව | * පිරිවැය පාලනය |
| නිෂ්පාදිත ක්‍රියාවලිය | වැඩ සටහන් | * ගබඩා පහසුකම් | * ක්‍රියාකාරී පාලනය |

06. (i) ව්‍යාපාරයක වත්කම්වල පැවැත්ම හා කාර්යක්ෂමතාවය සඳහා යොදාගන්නා සියලු ක්‍රියාමාර්ග නඩත්තුව යටතට ගැනේ. ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර. රථවාහන ආදියෙහි ක්‍රියාකාරිත්වයහොඳින් පවත්වාගෙන යාමට නිරන්තරව නඩත්තුව පිළිබඳ අවධානය යොමුවිය යුතුයි.
(සම්පූර්ණ පිළිතුරට ලකුණු 4යි, එසේ නැති ඒවාට පිළිතුරු අනුව ගැළපෙන ලකුණ ලබාදෙන්න)

(ii)(අ) * නිෂ්පාදන ක්‍රියාවලිය අඛණ්ඩම කරගත හැකිවීම.
* යන්ත්‍ර ක්‍රියා විරහිතවීමේදී සිදුවියහැකි වියදම් අඩුකරගත හැකිවීම.
* අනතුරු ගිනිගැනීම් අවම කරගතහැකිවීම.
* නිෂ්පාදනයේ සිදුවන අපතේයාම් අඩුකරගත හැකිවීම.
* නිෂ්පාදන ගුණාත්මය ආරක්ෂා කරගත හැකිවීම. (කරුණු 4 ලකුණු 2)

(ආ) JIT ක්‍රමය

| **වාසි** | **අවාසි** |
|---|---|
| * ගබඩා පිරිවැය අවම වීම. | * අමුද්‍රව්‍ය හිඟවීම් ඇතිවීම. |
| * තොග අවධානම අඩුවීම. | * හදිසි ඇනවුම්වලදී අමුද්‍රව්‍ය ගුණත්වය පිළිබඳ ගැටළු. |
| * නිමැවුම් එසැනින් වෙළඳපලට ඉදිරිපත් කළහැකිවීම. | * පිරිවැය ඉහළයා හැකිවීම. |

(නම් කිරීමට ලකුණු 1යි, වාසි 2ට හා අවාසි 2ට 1/2 බැගින් ලකුණු 1)

(iii) යෙදවුම්වලට හෙවත් අමුද්‍රව්‍ය වලට යම් වටිනාකමක් එකතුකර පුද්ගල වුවමනා ඉටුකර දෙන අයුරින් යම් නිමවුම් බවට පත්වීම.
නිෂ්පාදන කළමනාකරණය යනු : නිෂ්පාදන සැලැසුම්කරණය සම්පත් සංවිධානකරණය, සේවක ක්‍රියාකාරකම් මෙහෙයවීම. කාර්ය සාදනය හා නියාමනයයි.
(ප්‍රමාණවත් කරුණු ඉදිරිපත් කර ඇත්නම් සම්පූර්ණ ලකුණු දෙන්න)

(iv) (අ)

| **අලෙවිකරණය** | **අලෙවිය** |
|---|---|
| 1.පුළුල් ක්‍රියාවලියකි. | අලෙවිකරණයේ එක් කාර්යයකි. |
| 2. විකිණීමට පෙර හා පසුත් ක්‍රියාත්මක වේ. | අදාල කාර්යයෙන් පසු ගනුදෙනුව අවසන් වේ. |
| 3. පාරිභෝගිකයා කේන්ද්‍රකරගනී. | නිෂ්පාදිත විකිනීම කෙරෙහි අවධානය යොමුවේ. |
| 4.මිනිස් අවශ්‍යතා වුවමනා තෘප්තිමත් කිරීම තුළින් ව්‍යාපාරික අරමුණු ඉටුකර ගැනීම සඳහා වූ සමෝධානික ක්‍රියාවලියකි. | භාණ්ඩයක අයිතිය. මුල්‍යමය වටිනාකමක්මත වෙනත් පාර්ශවයක් වෙත පැවරීමකි. |

(කරුණු 4ට 1/2 බැගින් ලකුණු 2)

(ආ) 1. නිෂ්පාදන සංකල්පය 2. නිෂ්පාදිත සංකල්පය
3. විකුණුම් සංකල්පය 4. අලෙවිකරණ සංකල්පය (ලකුණු 2)

(v)(අ) 1. භූගෝලීය සාධක 2. ප්‍රජා විද්‍යාත්මක සාධක
3. මනෝ විද්‍යාත්මක සාධක 4. චර්යාත්මක සාධක(නම්කර පැහැදිලි කිරීමට ලකුණු 2, නම් කිරීමට ල. 1)

(ආ) 1. මැනිය හැකි බව. 2. ප්‍රමාණවත් බව. 3. ළඟාවිය හැකි බව
4. වෙන්කොට හඳුනාගත හැකි බව. (නම්කර පැහැදිලි කිරීමට ලකුණු 2)

07. (i) (අ) භාණ්ඩයක් හෝ සේවාවක් හෝ පිළිබඳව පාරිභෝගිකයන්ගේ මනසෙහි ඉඩක් ඇතිකරලීම වෙළෙඳ පොළෙහි ස්ථාපිතවීම ලෙස හැඳින්වේ. (ලකුණු 2)

(ආ) 1. භාණ්ඩ තුළ විවිධ ගුණාංග හා ප්‍රයෝජන ඇතුළත් කිරීම.
2. තරඟකරුවන්ට සාපේක්ෂව වඩා ඉහළ සේවාවක් ලබාදීම(හෝ පිළිගතහැකි වෙනත් පිළිතුරු 2ට ලකුණු 2)

(ii) කිසියම් විකුණුම්කරුවෙකු විකිණීමට ඉදිරිපත් කරන නිෂ්පාදිත කළඹ නිෂ්පාදිත මිශ්‍රය වේ.(ලකුණු 1)
(සුදුසු උදාහරණයක් මගින් දිග, පළල, ගැඹුර සංගතභාවය පැහැදිලි කිරීමට ලකුණු 3)

(iii) (අ) 1. හර ප්‍රතිලාභය 2. මූලික නිෂ්පාදිතය
3. අපේක්ෂිත නිෂ්පාදිතය 4. වැඩිදියුනු කළ නිෂ්පාදිතය 5. විභව නිෂ්පාදිතය
(හතරක් නම්කර පැහැදිලි කිරීමට ලකුණු 2, නම් කිරීමට පමණක් ලකුණු 1)

(ආ) 1. ප්‍රචාරණය 2. විකුණුම් ප්‍රවර්ධනය 3. පෞද්ගලික විකුණුම්
4. මහජන සම්බන්ධතා 5. සෘජු අලෙවිකරණය 6. ඉසව් හා අත්දැකීම්.(හතරක් නම් කිරීමට 1/2බැගින් ල 2)

(iv)(අ) ව්‍යාපාරයකට අවශ්‍ය අරමුදල් යෝග්‍ය මාර්ග වලින් සපයා ගැනීමේ හා එම අරමුදල් ඵලදායී ලෙස ව්‍යාපාර කටයුතුවල ආයෝජනය කරමින් අයිතිකරුගේ ධනය උපරිම කිරීමේ සියලු කටයුතු මූල්‍ය කළමනාකරණය වේ.

(ආ) අවශ්‍ය අරමුදල් පිළිවෙල සැලසුම් කිරීම, එම අවශ්‍යතා අනුව අරමුදල් සම්පාදනය කිරීම සහ ඒවා සඵලදායීව හා කාර්යක්ෂම ලෙස භාවිතා කිරීම මූල්‍ය කළමනාකරණයේ ප්‍රධාන කාර්යය වේ.

(v)(අ) 1. ව්‍යාපාරයේ මූල්‍ය සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
2. ව්‍යාපාරයේ මූල්‍ය ප්‍රවාහය නියාමනය කිරීම.
3. අය වැය සම්පාදනය
4. ආයෝජන නිර්දේශ කිරීම. (පිළිගතහැකි වෙනත් කරුනු 4ට ලකුනු 2)

(ආ)

| <u>අභ්‍යන්තර</u> | <u>බාහිර</u> |
|---|---|
| රඳවාගත් ලාභ | කොටස් නිකුතුව |
| වත්කම් විකිණීම් | ණයකර නිකුතුව (පිළිගත හැකි වෙනත් පිළිතුරු 4කට 1/2 බැගින් ලකුණු 2) |

08. (i) (අ) වත්කම්වල ආයෝජනය හා ඒවායින් ජනිතවන ඉපයීම් අතර ඇති සම්බන්ධතාවය පෙන්වන අනුපාත ක්‍රියාකාරී අනුපාත වේ. (ලකුණු 2)

(ආ) තොග පිරිවැටුම් අනුපාතය = $\frac{\text{විකුණූ භාණ්ඩවල පිරිවැය}}{\text{සාමාන්‍ය තොගය}}$ (ලකුණු 1)

$= \frac{110000}{55000} = 2$ (ලකුණු 1)

(ii)(අ) 1. මූලික ප්‍රසිද්ධ නිකුතුවක් මගින්
2. විකුණුම් අර්පණයක් මගින්
3. හඳුන්වාදීමක් මගින්. (ලකුණු 2)

(ආ) ප්‍රධාන පුවරුව. දිරිසවි පුවරුව. වොච් ලිස්ට් පුවරුව
(නම් කිරීමට 1/2 බැගින් ලකුනු 1 1/2, එකක් පැහැදිලි කිරීමට ලකුණු 1/2)

(iii) ශුද්ධ ලාභ අනුපාතය = $\frac{\text{ශුද්ධ ලාභය}}{\text{ප්‍රාග්ධන ආයෝජන}} \times 100$ (ලකුණු 1)

කළඹසඹ මාගම = $\frac{60000}{300000} \times 100$

= 20% (ලකුණු 1)

$$\text{මිතුරුසමාගම} = \frac{40000}{120000} \times 100$$

$$= 33.33\%$$ (ලකුණු 1)

යෙදවූ ප්‍රාග්ධනයට ඉපැයුම් කළණ සමාගම 20% කි. මිතුරු සමාගම 33.33% කි. ඒ අනුව මිතුරු සමාගම වඩා සාර්ථක වේ. (ලකුණු 1)

(iv)(අ) ආයතනයක පරමාර්ථ හා අරමුණු ඉටුකර ගැනීම සඳහා ආයතන සේවක අවශ්‍යතා නිශ්චය කිරීම හා එම අවශ්‍යතා ඉටුකර ගැනීම පිණිස ගතයුතු උපාය මාර්ග තීරණය කිරීම පිළිබඳ ක්‍රියාවලිය මානව සම්පත් සැලසුම්කරණයයි. (පැහැදිලි කිරීමට ලකුණු 2)

(ආ)
* මානව සම්පත් ඉල්ලුම පුරෝකථනය.
* මානව සම්පත් සැපයුම් තක්සේරුකිරීම.
* මානව සම්පත් ඉල්ලුම හා සැපයුම් සන්සන්දනය.
* මානව සම්පත් හිඟයට හෝ අතිරික්තයට ගතයුතු උපායමාර්ග සංවර්ධනය.
* මානව සම්පත් සැලැස්ම සකස් කිරීම.
* මානව සම්පත් සැලසුම්කරණ ප්‍රයත්නය ඇගයීම හා වැඩි දියුණු කිරීම. (ලකුණු 2)

(v)
* රැකියා ඇබෑර්තු හඳුනා ගැනීම.
* රැකියා නියමයන් අධ්‍යයනය කිරීම.
* ආකර්ෂණයට අදාළ සාධක සලකා බැලීම.
* අයදුම්පත පිළියෙළ කිරීම.
* ආකර්ෂණ ක්‍රමය තෝරාගැනීම.
* ක්‍රියාත්මක කිරීම.
* අයදුම්පත් ඇගයීම.

(පියවර අනුපිළිවෙළින් දක්වා කෙටි පැහැදිලි කිරීම් සිදුකිරීමට ලකුණු 4)